සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2017
இரண்டாம் தவணை மதிப்பீடு - 2017
Second Term Evaluation - 2017

6 ශ්‍රේණිය
தரம் 6
Grade 6

ගණිතය
கணிதம்
Mathematics

පැය දෙකයි
இரண்டு மணித்தியாலங்கள்
Two Hours


නම / විභාග අංකය : ..........................................................................................................

# I කොටස

- සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් ලැබේ.


1. a) වෘත්ත දෙකටම පොදු ලක්ෂ්‍යය වනුයේ ..............................

b) වෘත්ත දෙකටම පිටතින් පිහිටි ලක්ෂ්‍යය වනුයේ ..............................





2. 

| අධ්‍යාපන චාරිකාව පෙ.ව. 6.25ට ආරම්භ විය. | | අධ්‍යාපන චාරිකාව ප.ව. 5.10ට අවසන් විය. |
|---|---|---|



අධ්‍යාපන චාරිකාවට ගතවූ කාලය පැය හා මිනිත්තු වලින් සොයන්න.


3. පහත දී ඇති උපකරණ භාවිතයෙන් හඳුනාගත හැකි තල මොනවාද?



4. පහත දී ඇති හිස්තැන්වල චතුරස්‍ර වර්ග 3ක් ලියන්න.

.............................. , රොම්බසය, .............................. , සෘජුකෝණාස්‍රය


5. 




භාජන දෙකෙහිම ඇති ද්‍රව පරිමාවන් සමානවීම සඳහා A භාජනයෙන්, B භාජනයට දැමිය යුතු ජල පරිමාව කොපමණද?

6. 12 500 004 සංඛ්‍යාව සම්මත ආකාරයට වචනයෙන් ලියා දක්වන්න.

7. දී ඇති හිස්කොටුව තුල දී ඇති ප්‍රකාශයන් 'සත්‍ය' හෝ 'අසත්‍ය' වන බව ලියා දක්වන්න.

| | |
|---|---|
| බිංදුව ධන නිඛිලයකි. | |
| සංඛ්‍යා රේඛාව මත ලකුණු කර ඇති සංඛ්‍යා නිඛිල වේ.  | |
| 4 > (-4) යන්න අසත්‍යයකි. | |

8. පහත දී ඇති පියවරයන්හි වැරදි පියවර රවුම්කර දක්වන්න.

a) $\frac{3}{4} + \frac{1}{8}$

$= \frac{3 \times 3}{2 \times 4} + \frac{1}{8}$

$= \frac{6}{8} + \frac{1}{6}$

$= \frac{7}{8}$

b) $\frac{7}{10} - \frac{1}{5}$

$= \frac{7}{10} - \frac{1 \times 2}{5 \times 2}$

$= \frac{7}{10} - \frac{2}{10}$

$= \frac{9}{10}$

9. ☐. 54 සංඛ්‍යාව 1ට වඩා අඩු සංඛ්‍යාවක් වීමට හිස්කොටුව තුල ගැලපෙන ඉලක්කමක් යොදන්න.

10. ඝණකයක්, ඝණකාභයක් බවට හැරවීමට සිදුකළ යුතු නිවැරදි පියවර යටින් ඉරක් අඳින්න.

a) දාරවල දිග සමාන කරන්න.

b) ශීර්ෂ සංඛ්‍යාව අඩු කරන්න.


c) මුහුණත් සංඛ්‍යාව අඩු කරන්න.

11. පාසැලක ශිෂ්‍ය සංඛ්‍යාව 1600කි. එක පංතියක සාමාන්‍යයෙන් සිටින ශිෂ්‍ය සංඛ්‍යාව 32 කි. පාසැලේ ඇති පංති සංඛ්‍යාව සොයන්න.

12. 20ට අඩු සමචතුරස්‍ර සංඛ්‍යා තෝරා ලියන්න.

| | | |
|---|---|---|
| 3 | 12 | 4 |
| 10 | 20 | 16 |

13. ඊළඟ රටාව ඇඳ දක්වන්න.




14. වෘත්තාකාර කඩදාසියක අරය සොයාගැනීමට වාර කීයක් නවා ගත යුතුද?


15. රූපසටහනේ දක්වා ඇති කෝණ නම් කරන්න.

a = ................................


b = ................................





16. හිස්තැන්වලට ගැලපෙන සංඛ්‍යා ලියන්න.




17. දී ඇති ත්‍රිකෝණයේ පරිමිතිය සොයන්න.





18. ගණකරාමුවේ ඇති දශම සංඛ්‍යාව ලියා දක්වන්න.




19. ආසන්න 10ට වැටයූ විට 40 ලැබිය හැකි කුඩාම සංඛ්‍යාව කීයද?


20. දී ඇති රූපයේ ඇති සමචතුරස්‍රයේ සංඛ්‍යාව කීයද?



## II කොටස

- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පිළිතුරු වෙනත් කඩදාසියක ලියා එ... I කොටසට අමුණන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 16ක් ද, ඉතිරි ප්‍රශ්න වලට ලකුණු 11 බැගින් ද හිමිවේ.

1. a) රූපයේ දක්වා ඇත්තේ සිසුවෙක් විසින් ඝණ වස්තුවක් සෑදීම සඳහා කපන ලද පතරොමකි.





i) ඉන් සෑදිය හැකි ඝණ වස්තුව කුමක්ද?

ii) සාදන ලද ඝණ වස්තුවේ දාරයක දිග කීයද?

iii) එම ඝණ වස්තුවේ දැකිය හැකි ලක්ෂණ 2ක් ලියන්න.

b) පහත දී ඇති සංඛ්‍යා හා රූප ඒවායේ ලක්ෂණ අනුව සමූහ 4කට වෙන්කර ගැලපෙන නාමයන් ලියන්න.




ඉංග්‍රීසි හෝඩියේ ස්වර

c) සුළු කරන්න.

i) $64.5 + 6.45 =$

ii) $324 \times 100 =$

iii) $8945 + 1275 - 3496 =$

2. i) තුල්‍ය භාග දැනුම භාවිතයෙන් හිස්තැන් පුරවන්න.

$$\frac{2}{5} = \frac{\square}{20} = \frac{18}{\square}$$

ii) පහත දී ඇති භාග ආරෝහණ ක්‍රමයට සකසන්න.

$$\frac{1}{4}, \frac{1}{8}, \frac{1}{2}, \frac{1}{5}, \frac{1}{10}, \frac{1}{7}$$


iii) සුළු කරන්න. $\frac{11}{24} + \frac{1}{4} =$

iv) සුළු කරන්න. $\frac{3}{5} - \frac{2}{15} =$


3. a) දී ඇති රූපය පිටපත් කර පහත දී ඇති කෝණවලට අදාළ අකුරු යොදා ලකුණු කරන්න.

a - සුළු කෝණය    b - සෘජු කෝණය

c - මහා කෝණය    d - පරාවර්ත කෝණය



b)




දී ඇති රූප සටහනට අනුව හිස්තැන් පුරවන්න.

i) කමල් සිටිනුයේ සුනිල්ට .............................. දිශාවෙනි.


ii) මාලා ජෙනිෆර්ට .............................. දිශාවෙන් සිටී.


iii) .............................. රවිට නිරිත දිශාවෙන් සිටී.


iv) .............................. කමල්ට බටහිර දිශාවෙන් ද ෆාතිමාට උතුරු දිශාවෙන් ද සිටී.


v) මාලාට නිරිත දිශාවෙන් සිටින අජිත් රූප සටහනේ ඇඳ දක්වන්න.


4. i) වරහන් තුල දී ඇති පද අතරින් පහත දක්වා ඇති තල රූප වලට ගැලපෙන පද තෝරා අදාළ අක්ෂරය ඉදිරියෙන් ලියන්න. (සංවෘත වක්‍රදාර සහිත, විවෘත සරල දාර සහිත, සංවෘත සරල දාර සහිත, විවෘත වක්‍ර දාර සහිත, සංවෘත)

a) 
..........................


b) 
..........................

c) 
..........................

d) 
..........................

e) 
..........................

ii) දී ඇති තල රූප වල නාමයන් අදාළ අක්ෂරය ඉදිරියෙන් ලියන්න.





a) ..........................    b) ..........................


c) ..........................    d) ..........................

e) ..........................    f) ..........................

5. a) i) දිග මිනුම ආශ්‍රිත විවිධ මිණුම් අවස්ථාවන් හිස්කොටු තුළ ලියන්න.




ii) දී ඇති රූපයේ පරිමිතිය 32cm නම්, $x$ මගින් දැක්වෙන දිග සොයන්න.




b) i) දී ඇති පළතුරු යුෂ බෝතලයෙන් 350$ml$ වීදුරු කීයක් පිරවිය හැකිද? (උපරිම)

ii) එම වීදුරු සම්පූර්ණයෙන් පිරවූ පසු බෝතලයේ ඉතිරි වන බීම ප්‍රමාණය කොපමණද?




6. a) පහත දී ඇති සංඛ්‍යා රටා නම් කරන්න.

i) 1, 3, 5, 7, 9, .............. ⟶

ii) 1, 4, 9, 16, .............. ⟶

iii) 2, 3, 5, 7, 11, .............. ⟶

iv) 1, 3, 6, 10, 15, .............. ⟶

v) 2, 4, 6, 8, .............. ⟶

vi) 4, 6, 8, 9, 10, .............. ⟶

b) කඩුවෙල සිට ගාල්ල දක්වා ගමන් කළ හැකි මාර්ග 2ක් පවතී.

* අධිවේගී මාර්ගයෙන් පැය 1යි මිනිත්තු 10ක් ගතවේ.
* සාමාන්‍ය මාර්ගයේ පැය 3යි මිනිත්තු 20ක් ගතවේ.

i) කාදර් සාමාන්‍ය මාර්ගයෙන් ගාල්ලෙන් මධ්‍යහ්න 12.00 ට ගමන් ආරම්භකර සාමාන්‍ය මාර්ගයෙන් කඩුවෙලට ළඟාවන වේලාව කීයද?

ii) ශාන්ති කඩුවෙලින් ගමන් ආරම්භකර අධිවේගී මාර්ගයෙන් ගාල්ලට ගොස් ඒ විගසින්ම නැවත ආපසු එම මාර්ගයේම ප.ව. 12.50 වන විට නැවතත් කඩුවෙලට ළඟා වූවාය. ශාන්ති කඩුවෙලින් ගමන් ආරම්භ කර ඇත්තේ කීයටද?

7. a) (-3) සිට (+2) දක්වා සංඛ්‍යා රේඛාවක් ඇඳ ඍණ නිඛිල රවුම්කර දක්වන්න.

b) හිස්තැන් වලට ගැලපෙනසේ $<$ හෝ $>$ ලකුණ යොදා සම්පූර්ණ කරන්න.

i) (-8) ....... 8

ii) 0 ....... -5

iii) 0.8 ....... 0.88

iv) 5.02 ....... 5.2

c) $5\frac{3}{4}l$, $1\frac{1}{2}l$, $5.5l$, $2\frac{1}{4}l$, $2.5l$

ඉහත දී ඇති ද්‍රව පරිමා අවරෝහණ පිළිවෙලට ලියා දක්වන්න.